මැදදුම්බර ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 02 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල එකතුව සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර, රු.1,428,192 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු කාර්යාල උපකරණවල වටිනාකම රු.1,008,239 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.1,296,770 ක් වටිනා භාණ්ඩ ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ ගිණුම්ගත නොකර වැය විෂයයට හර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී රූපලාවන්‍ය හා ආහාර සැකසුම් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ අතර, ඒ වෙනුවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු රු.226,660 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාළව ලැබී තිබුණු රු.115,705 ක උසාවි දඩ හා රු.1,327,450 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම සහ ලැබිය යුතු මුද්දර ගාස්තු උපකල්පන පදනම මත ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) කසළ කරත්ත 28 ක වටිනාකම රු.304,942 ක් ලෙස දක්වා තිබුණද, භෞතිකව නිරීක්ෂණය වූයේ කසළ කරත්ත 10 ක් පමණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.528,000 ක් වටිනා ජල මීටර 160 ක් ලැබීම් යටතේ ගිණුම්ගතකර නොතිබුණු අතර, අවසන් ජල ගබඩා තොගයෙන්ද අත්හැරී තිබුණි.

(ඍ) ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතු 04 කට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු පොලිය ගණනය කර ගිණුම්ගතකර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කර තිබුණු භාණ්ඩ වර්ග 23 ක අයිතම 155 ක වටිනාකම ගණනය කර පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ගොඩනැගිලි 2 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 75 ක් මිලදී ගැනීම වෙනුවෙන් දරා තිබුණු රු.41,250 ක මුදල පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂයක එකතු වටිනාකම රු.27,475,465 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1-5 අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.11,948,817 ක් හා වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකළ ශේෂවල වටිනාකම රු.996,203 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක එකතු වටිනාකම රු.32,984,654 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 - 5 ත් අතර කාලයක් තිස්සේ නිරවුල් නොකළ ශේෂ එකතුව රු.13,341,080 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,643,942 ක් වී තිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.37,312,839 ක් වූ ගනුදෙනු 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම

--------------------

1.3.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | **රු.** | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | | සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් වලින් සියයට 1 ක ආදායම ලබා ගැනීමේදී සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් ප්‍රකාශන මත ලබා නොගෙන කළමනාකරු විසින් ලබා දුන් ආදායම් වාර්තාවක් අනුව ආදායම් ලබාගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) (ආ) ඡේදය | 5,789,310 | වසර 2 ක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 10 වගන්තිය | | කඩ කාමර අතුරු බදු දීම සම්පූර්ණයෙන් තහනම් වුවද, බදුකරුවන් විසින් විවිධ පුද්ගලයන් වෙත විවිධ කුලී මුදල් අයකර අතුරු බදු දීම සිදුකර තිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4 | 756,625 | එක් ආයතනයකින් මිල ගණන් කැඳවා දේශන ශාලා පුටු 100 ක් මිලදීගෙන තිබුණි. |

1.3.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම
-------------------------------------------

2010 වර්ෂයේ සිට පැවත එන රු.24,082 ක් එකතු කළ අගය මත බදු මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,711,330 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,652,343 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 1,883,842 | 1,870,857 | 1,854,300 | 2,252,534 | 1,597,083 | 1,814,760 | 2,029,359 | 2,349,266 |
| (ii) කුලී | 2,771,989 | 1,971,998 | 1,748,857 | 3,593,541 | 3,963,421 | 1,758,298 | 1,569,163 | 3,660,688 |
| (iii)ජල ගාස්තු | 1,872,960 | 1,985,103 | 2,153,023 | 929,963 | 1,758,240 | 1,863,887 | 1,913,817 | 1,094,893 |
| (iv)බලපත්‍ර ගාස්තු | 2,784,915 | 2,810,049 | 2,808,799 | 60,350 | 4,974,387 | 2,382,144 | 2,369,394 | 71,850 |
| (v)වෙනත් ආදායම් | 404,580 | 484,560 | 181,040 | 1,812,060 | - | 424,080 | 477,490 | 1,676,060 |
| | 9,718,286 | 9,122,567 | 8,746,019 | 8,648,448 | 12,293,131 | 8,243,169 | 8,359,223 | 8,852,757 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු කඩ කාමර හා ඉඩම් බදු දීමෙන් ලබාගත යුතු ආදායම් කාලීනව ලබාගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ව්‍යාපාරික ආයතනවලින් කසළ ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වරිපනම් අය කිරීම සඳහා දියුණු ප්‍රදේශ වශයෙන් ගැසට් කර තිබූ සමහර ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය අවම පහසුකම් හෝ ලබා දීමට සභාව කටයුතු නොකිරීම නිසා එම ප්‍රදේශවලින් වරිපනම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

--------------------

(අ) වරිපනම්

------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.2,246,265 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.483,871 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.1,477,899 ක් වූ අතර, එයින් අයකරගෙන තිබුණේ රු.862,407 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.2,138,051 ක් වූ අතර, එම ශේෂය තුළ වසර 5 ක කාලයක් ඉක්මවූ රු.1,347,818 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.100,000 ක වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.14,164 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 14 ක තරම් ඉතා අඩු අගයක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.114,483 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයක කාලයක් ඉක්මවූ රු.85,856 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි.

2.2.4 කුලී

-------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුලී හා බදු කුලී ශේෂය රු.3,593,541 ක් වූ අතර, වර්ෂයකට වඩා පෙර සිට පැවත එන හිඟහිටි ශේෂය රු.2,689,013 ක් විය.

2.2.5 බලපත්‍ර ගාස්තු

------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.60,350 ක් වූ අතර, එම ශේෂය වර්ෂ 1-5 ත් අතර කාලයකට අදාළ විය.

2.2.6 වෙනත් ආදායම්

-------------------

(අ) රථ වාහන කුලී ආදායම්

----------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.1,676,060 ක හිඟ ශේෂයක් පැවති අතර, බිල් කිරීම් රු.484,650 ක් විය. මෙම ශේෂයන්ගෙන් වර්ෂයේ අය කිරීමේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට 9 ක් හා 37 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,812,060 ක හිඟයක් පැවති අතර, ඉන් වර්ෂයක කාලයක් ඉක්මවූ ශේෂය රු.1,508,540 ක් විය.

(ආ) ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.1,094,893 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.616,108 ක මුදලක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 56 ක අගයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.929,963 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයක කාලයක් ඉක්මවූ රු.478,784 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි.

(ඇ) රැස්වීම් ශාලාවේ ආදායම

----------------------------

සභාව සතුව පැවති තෙල්දෙණිය බස් නැවතුම්පළෙහි පිහිටි රැස්වීම් ශාලාව කුලියට ලබා දීමෙන් සමාලෝචිත වර්ෂයේදී ලබාගත හැකිව තිබුණේ රු.45,000 ක ආදායමක් පමණි.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.879,086 ක් හා මුද්දර ගාස්තු රු.6,701,097 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා ආඥා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 33 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 5 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 4 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

---------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 34 කින් 29 ක් සඳහා පමණක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසීම නිසා කර්තව්‍යයන් 6 ක් ඉටු කළනොහැකි වී තිබුණි.

(ඈ) අරමුණුගත කාර්යයන් ඉටු නොකිරීම

------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වාර්ෂික අයවැය මඟින් කර්තව්‍යයන් 33 ක් ඉටු කිරීම සඳහා යෝජනා කර තිබුණද ඉටු කර තිබුණේ කර්තව්‍යයන් 2 ක් පමණි.

(ii) ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ අරමුණුගත කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායමෙන් වැයකර තිබුණේ සියයට 14 ක් පමණි.

(ඉ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම
----------------------------------------------------------

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ කාර්යයන් 4 ක් ඉටු කිරීම සඳහා රු.37,202,820 ක් වැය කර අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිලාභ (out come) අත්පත් කරගෙන නොතිබූ අවස්ථා පහත දැක්වේ.

| | කර්තව්‍යන් | 2017 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ------------- | ---------------------- | ---------------- |
| | | රු. | |
| (i) | තෙල්දෙණිය බස් නැවතුම්පොළ හා ශ්‍රවනාගාරය ඉදිකිරීම | 34,336,581 | 2017 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය සිදු කර තිබුණේ අවස්ථා 18 ක් වූ අතර, ඉපයූ ආදායම රු.45,000 ක් පමණක් වීමෙන් ඌන උපයෝජිතව පැවතීම. |
| (ii) | මීරියගොල්ල තාවනේවැව ප්‍රතිසංස්කරණය | වටිනාකම සොයාගත නොහැක | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගම් 6 ක ජනතාවට පානීය ජලය ලබාදීමේ අරමුණින් 2013 වර්ෂයේ මෙම වැව ඉදිකර ඇතත්, ජනතාවට පානීය ජලය ලබා දී නොතිබුණි. |
| (iii) | ළමා උද්‍යානයේ වැසිකිළියක් ඉදිකිරීම | 1,991,802 | වැසිකිළියක් ඉදිකර තිබුණද, ළමා උද්‍යානය ඉදි නොකිරීම හේතුවෙන් ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. |
| (iv) | ළමා උද්‍යානයේ බැම්මක් ඉදිකිරීම | 874,437 | ළමා උද්‍යානය මහජන පරිහරණය සඳහා සුදුසු මට්ටමකට සකස් කිරීමට බැම්මක් ඉදිකර ඇතත්, ළමා උද්‍යානයක් ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු බැවින් දරා තිබුණු වියදම නිෂ්කාර්ය වී තිබුණි. |
| | | -------------- | |
| | | 37,202,820 | |
| | | ========= | |

(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන ටොන් 04 ක පමණ ඝන අපද්‍රව්‍ය සභාවේ ට්‍රැක්ටර් හා සේවකයින් යොදවා වෙන්කර ලබාගෙන දිරන කසළ කුණ්ඩසාලේ කොම්පෝස්ට් අංගනයට යැවීම සඳහා 2017 වර්ෂය තළ රු.70,295 ක වියදමක් දරා තිබුණි. නොදිරන කසළ වෙන්කළ හැකි ප්‍රමාණය ලබාගෙන ඉතිරි ද්‍රව්‍ය බස් නැවතුම්පළ අසළ

ඉඩමකට බැහැර කර තිබූ අතර, උඩිස්පත්තුව නගරය ආශ්‍රිතව දිනපතා එක්රැස්වන අපද්‍රව්‍ය රංගල තෙල්දෙණිය ප්‍රධාන මාර්ගය ආසන්නයේ බැහැර කිරීම සිදු කර තිබුණි. ඒ අනුව ප්‍රදේශයේ එකතුවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමෙන් තොරව පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි. කසළ එකතු කිරීම වෙනුවෙන් රු.9,983,570 ක පමණ පිරිවැයක් දරා තිබුණද එම වියදම ආවරණය කර ගැනීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

(උ) තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ජල ව්‍යාපෘති 4 ක් පැවති අතර, ජල පාරිභෝගික සංඛ්‍යාව 1066 ක් විය. ඉන් ජලමනු සවිකර තිබුණේ 526 දෙනෙකු සඳහා පමණක් වන අතර, ඉතිරි පාරිභෝගිකයින් 540 දෙනෙකුගෙන් රු.200 ක ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණු රු.160,728 ක අත්තිකාරම් ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

-----------------------------------

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර, තනතුරු 14 ක පුරප්පාඩු 27 ක් පැවතුණු අතර, පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු සතිපොළ ගවමස් කඩ හා මාළු කඩ බදු දීමෙන් 2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ හිඟව පවතින රු.1,075,621 ක ආදායම අයකරගෙන නොතිබුණි.

(ආ) සභාව සතු ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කමර හා ඉඩම් බදු දීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,017,899 ක මුදලක් අයවිය යුතුව ඇතත්, මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-------------------------------

3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

-------------------------------------------

සභාව සතු ට්‍රැක්ටයක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු නොකර වසර ගණනාවකට පෙර සිට නිෂ්කාර්යව කාර්යාල භූමියේ ගාල් කර තිබුණි.

3.5.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

--------------------------------------------------------

(අ) සභාව සතු රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරයෙන් 2017 වර්ෂයේ කිසිදු ආදායමක් ලබා නොගෙන කාර්යාල භූමියේ නිෂ්කාර්යව දමා තිබුණි.

(ආ) ජල බවුසරය සහ ට්‍රේලරයක් ඌන උපයෝජිතව කාර්යාල භූමියේ දමා තිබුණි.

3.5.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මධ්‍යම පළාත් සභාවෙන් ලබා දී තිබුණු රු.1,500,000 ක් වටිනා කැබ් රථයක් 2016 වර්ෂයේ ඇස්තීසි නියෝගයක් මත තහනමට ලක්කර තිබුණු අතර වාහනය දිරාපත් වෙමින් සභා භූමියේ පැවතුණි.

(ආ) මධ්‍යම පළාත් සභාවෙන් ලැබුණු රු.600,000 ක් වටිනා සභාව සතු ජීප් රථයක් සහ යතුරු පැදියක් වසර 5 කට වැඩි කාලයක් ක්‍රියා විරහිතව පැවතුණි.

3.5.4 වාර්ෂික භාණ්ඩ / තොග සමීක්ෂණය

------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තා අනුව පුස්තකාල 05 ක රු.64,348 ක් වටිනා පොත් 699 ක් සහ වටිනාකම සඳහන් කර නොමැති පොත් 07 ක් අස්ථානගත වී තිබූ අතර, මෙම අලාභය අය කර ගැනීමට කටයුතු කර නො ාතිබුණි.

(ආ) තෙල්දෙණිය මහජන පුස්තකාලයේ ජංගම සේවයේ පොත් සමීක්ෂණය කිරීමේදී රු.15,999 ක් වටිනා පොත් 160 ක ඌනතාවයක් පැවතියද ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) කාලයක් තිස්සේ පාඨකයින්ට ලබා දී ආපසු ලබා නොදුන් රු.5,395 ක් වටිනා පුස්තකාල පොත් 16 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

----------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.1,776,879 ක ප්‍රාග්ධන වියදම දරා තිබුණද සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

වතුලියැද්ද පිටවත්ත මාර්ගය සංවර්ධනය කිරීම රු.1,200,000

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විශේෂ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රු.1,000,000 ක සහ පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ රු.200,000 ප්‍රතිපාදන මත වතුලියැද්ද පිටවත්ත මාර්ගය සංවර්ධනය කිරීම මොරගහමුල ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ ගිවිසුම්ගතව වැඩ නිම කර තිබූ අතර, ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක HSR - ST 047 අනුව 1:2:4 (3/4) මිශ්‍රණයෙන් 5" ඝනකමට මාර්ග

තලය හා කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා ඝන මීටර 68.4 කට ඝන මීටරයකට රු.14,713.50 ක් බැගින් රු.1,006,402 ක් ගෙවීම්කර තිබුණි. මෙම මාර්ගය 2017 ඔක්තෝබර් 18 දින ස්ථාන 3 කින් පළුදු කර භෞතිකව පරීක්ෂා කිරීමේදී කොන්ක්‍රීට් තට්ටුවේ ඝනකම අඟල් 4 , 3 1/2 සහ 4 ලෙස විවිධ මට්ටම්වල පැවතුණි. මේ අනුව ඇස්තමේන්තුව පරිදි අනුව මාර්ගය කොන්ක්‍රීට් කර නොතිබියදී කොන්ක්‍රීට් වැඩ සඳහා ඝනමීටර් 12.86 ක් සඳහා රු.14,713.50 බැගින් රු.189,216 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, මෙම මාර්ගය ආරම්භයේ සිට මීටර 100 ක් පමණ දුරින් එක් ස්ථානයක් සම්පූර්ණයෙන්ම හරස් අතට ඉරිතලා (Crack) තිබුණු බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයන් 4 ක් සඳහා සලසා දී තිබුණු රු.170,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයන් 10 ක අයවැය ප්‍රතිපාදනය හා වැය මාරු කිරීම් අතර, සියයට 55 සිට සියයට 756 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) වැය විෂයන් 6 ක රු.8,128,200 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ නමුත්, කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

2017 ඔක්තෝබර් 19 දින වන විටත් ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයට කිසිදු නිලධාරියකු පත්කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු 3 ක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය නොකිරීම. |
| | | (ii) | ඇතැම් ස්ථාවර වත්කම් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබීම. |
| | | (iii) | පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වාහන හා යන්ත්‍රෝපකරණ පවරාගෙන නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | සභාව සතු සියළු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | දීර්ඝකාලීනව පැවත එන ශේෂ නිරවුල් නොකිරීම. |
| (ඇ) | ආදායම් පාලනය | (i) | සභාවේ කඩ කාමරවල තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) | වෙළඳ බලපත්‍ර පිළිබඳව වර්ෂය ආරම්භයේ විධිමත්ව සමීක්ෂණ නොපැවැත්වීම. |
| | | (iii) | හිඟ ආදායම් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඈ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | දිගු කාලයක් තිස්සේ නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පාලනය | (i) | ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීම. |
| | | (ii) | ප්‍රජාපාදක සමිති වලට ලබාදුන් ඇතැම් සංවර්ධන යෝජනා අසාර්ථක මට්ටමක පැවතීම. |
| | | (iii) | මාර්ග සංවර්ධන යෝජනා ඉටුකළ පසු පරීක්ෂණ වාර්තා (Hammer Test) ලබා නොගෙන ගෙවීම් සිදු කර තිබීම. |
| (ඊ) | ගබඩා පාලනය | (i) | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කර නොතිබීම. |
| | | (ii) | මිලදී ගෙන නිකුත් කළ ඉදිකිරීම් ද්‍රව්‍ය සභාවේ විවිධ ස්ථානවල දමා තිබීම. |